ISSN: 1391- 474 X

*'අන්වේෂණා' පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය මගින් වාර්ෂිකව පළ කෙරෙන සවිද්වත් සමාලෝචිත ශාස්ත්‍රීය සංග්‍රහයයි. 1999 වර්ෂයේ පළමු වරට ප්‍රකාශයට පත් කළ 'අන්වේෂණා', එදා සිට අද දක්වා බුදුසමය සහ තදනුබද්ධ විෂයයන්ට අදාළ පර්යේෂණ ලිපි පළ කිරීමෙන් විෂයක්ෂේත්‍රයෙහි ගුණාත්මක ප්‍රගතියට සාධනීයව දායක වී ඇත.*

මුද්‍රණය
**ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂන්ස් සෙන්ටර්**
444/3B,
පිටිපන දකුණ,
හෝමාගම.



# අන්වේෂණා

කැලණිය විශ්වවිද්‍යාලයීය
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ
ශාස්ත්‍රීය සංග්‍රහය

6 වන වෙළුම - 2016
**මහාචාර්ය අසංග තිලකරත්න උපහාර අංකය**

**උපදේශක සංස්කාරක**
මහාචාර්ය පූජ්‍ය කොටපිටියේ රාහුල හිමි

**සංස්කාරකවරු**
රළුවේ පද්මසිරි හිමි
මිරිස්වත්තේ විමලඤාණ හිමි

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
අංක 113, දුටුගැමුණු වීදිය, කොහුවල

පතඤ්ජලී මහාභාෂ්‍යයෙහි කී පරිදි පාරිභාෂික ශබ්ද නිර්මාණය කිරීමේ පරමාර්ථය සංක්ෂේපය යි.[1] පාණිනීන් විසින් අෂ්ටාධ්‍යායීයෙහි භාවිත කළ පාරිභාෂික ශබ්ද පතඤ්ජලී විසින් වර්ග දෙකකට බෙදා දක්වා ඇත.

i. අකෘත්‍රිම සංඥා - ටි, ඝි වැනි යෙදුම්

ii. කෘත්‍රිම සංඥා - අව්‍යය, ප්‍රාතිපදික, සර්වනාම වැනි යෙදුම්

# ශබ්ද විචාරය හා සම්බන්ධ පාලි පාරිභාෂික ශබ්ද පිළිබඳ විමසුමක්

මැදගම්පිටියේ විජිත ධම්ම හිමි

## හැඳින්වීම

නිශ්චිත වූ විෂයයක් තුළ ව්‍යවහාර වන ශබ්ද සමුච්චය ඒ විෂය හා බැඳී ඇති පාරිභාෂික ශබ්දමාලාව සේ සැලකේ. ව්‍යාකරණය, දර්ශනය, මනෝවිද්‍යාව, වෛද්‍ය විද්‍යාව, පරිගණක විද්‍යාව වැනි විෂය ක්ෂේත්‍රවලට අදාළ ග්‍රන්ථ පරිශීලනය කිරීමේ දී ඒවාට ආවේණික වූ වචන පිළිබඳ පරිචයක් ඇති කරගැනීම අනිවාර්ය වූවකි. එසේ නොමැති ව එම විෂයය හදාළ නොහැකි බැවිනි. නිශ්චිත විෂයක් සඳහා නිර්මාණය වී ඇති මෙවැනි ශබ්ද සමූහ එම විෂයයේ භාෂාව වෙයි.

පතඤ්ජලීගේ මෙම වර්ගීකරණය පාලි ව්‍යාකරණයට අදාළ පාරිභාෂික ශබ්ද කෙරෙහි ද ආදේශ කළ හැකිය. ඒ අනුව දීඝ, රස්ස, නිග්ගහීත වැනි යෙදුම් අකෘත්‍රිම කොටසට අයත් වේ. කෘත්‍රිම කොටසට වැටෙන පාරිභාෂික ශබ්ද සීමා සහිත ය. නාම වරනැගීමේ ශබ්ද පන්ති වෙන් කිරීම සඳහා සම්පාදිත ඝ, ල, ප වැනි සංඥාවන් මෙම කොටසට අයත් වේ. ස්ත්‍රී ලිංග ඊකාරාන්ත ඌකාරාන්ත ශබ්ද හැඟවීම පිණිස කච්චායන සම්ප්‍රදායෙහි වෙසෙසින් ම රූපසිද්ධියෙහි පැහැදිලි ව විස්තර වන නදී[2] යන සංඥාව මේ ගණයේ විශේෂ පාරිභාෂික ශබ්දයකි. එහෙත් එම සංඥාව මොග්ගල්ලායන සම්ප්‍රදායයෙහි සඳහන් නොවන බව ද මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතුය.

පාලි ව්‍යාකරණ සාහිත්‍යයෙහි ඉතා සුවිසල් නිර්මාණ දෙකක් වන මුඛමත්තදීපනිය හා සද්දනීතිය මේ පිළිබඳ වර්ගීකරණ ඉදිරිපත් කර ඇත. මුඛමත්තදීපනිය සංඥාවන් වර්ග තුනක් යටතේ සංග්‍රහ කරයි.[3]

i) *අන්වත්ථ සඤ්ඤා* (අර්ථයට අනුගත වූ අක්ඛර වැනි පාරිභාෂික ශබ්ද)
ii) *සක සඤ්ඤා* (ස්වකීය සම්ප්‍රදායට අයත් වග්ග වැනි පාරිභාෂික ශබ්ද)
iii) පර සඤ්ඤා (අන්‍ය සම්ප්‍රදායවලට වෙසෙසින්ම සංස්කෘතයට අයත් ඝෝෂ වැනි පාරිභාෂික ශබ්ද)

සද්දනීතිය[4] සඳහන් කර ඇති ආකාරයට සඤ්ඤා වර්ග දෙකක් පාලි ව්‍යාකරණයෙහි ඇතුළත් ව ඇත. එනම්,

i) මූල සඤ්ඤා (අක්ඛර, සර, බ්‍යඤ්ජන වැනි මූලික පාරිභාෂික ශබ්ද)
ii) උපකරණ සඤ්ඤා (සන්ධි ආදි ව්‍යාකරණ කටයුතු සඳහා යොදා ගැනෙන පුබ්බ, පර, ලොප, ආගම වැනි පාරිභාෂික ශබ්ද)

මෙම පාලි ව්‍යාකරණ ග්‍රන්ථ දෙකින් ඉදිරිපත් වූ වර්ගීකරණ පාලි ව්‍යාකරණයට අදාළ පාරිභාෂික ශබ්ද පිළිබඳ සාම්ප්‍රදායික වර්ගීකරණ සේ හඳුනාගැනීම වඩා සුදුසු ය. නූතන වාග්විද්‍යාත්මක ප්‍රවේශයකින් පාලි ව්‍යාකරණයෙහි පාරිභාෂික ශබ්ද විමර්ශනය කළ හැකි අතර මෙහි ලා ඉදිරිපත් වන්නේ එවන් විමර්ශනයක ප්‍රතිඵල යි. ශබ්ද විචාරය හා සම්බන්ධ පාලි පාරිභාෂික ශබ්ද පිළිබඳ සංක්ෂිප්ත විමසුමක් පහතින්



පළ වෙයි. මෙම විමර්ශනයේ දී පාලි ව්‍යාකරණයේ ප්‍රධාන ගුරුකුල දෙකක් වන කච්චායන හා මොග්ගල්ලායන සම්ප්‍රදායයන්හි අග්‍රේසර පරිවාර කෘති සේ සම්භාවිත රූපසිද්ධිය හා පයෝගසිද්ධිය මූලාශ්‍රය ග්‍රන්ථ සේ භාවිත කෙරිණ.

## 1. අක්ඛර/වණ්ණ

අක්ඛර (සංස්. අක්‍ෂර) හා වණ්ණ (සංස්. වර්ණ) යන වචන දෙක පාලි භාෂාව තුළ මනාව ස්ථාපනය වූ වචන දෙකකි. ඒවායින් අක්‍ෂර යන්නෙහි මූලික අර්ථය ක්‍ෂය නොවන (චිරස්ථායී) යනු යි.[5] වණ්ණ යන්නෙහි මූලික අර්ථය පැහැය යනු යි.[6]

පසුකාලයේ දී මෙම වචන දෙකෙහි මූලික අර්ථ යටපත් ව ගොස් ලියනු ලබන ශබ්ද සංකේත හඳුන්වන වචන ලෙස ව්‍යවහාරයට පැමිණ ඇත. පාෂාණවල කොටා ඇති සංකේතවලට අක්‍ෂර යන නාමය යොදන්නට ඇත්තේ ඒවායේ චිරස්ථායී භාවය නිසා යැයි කේ. සී. චැටර්ජි පවසයි. එම අක්‍ෂර සඳහා වර්ණ යන නාමය යොදන්නට ඇත්තේ ආරම්භයේ දී පාෂාණ මත තිබූ සංකේතවල යම් වර්ණයක් ආලේප කර තිබූ හෙයින් විය යුතුයැයි ද ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කරයි.[7]

වර්ණ ශබ්දයෙන් ඉදිරිපත් කෙරෙන 'පැහැය' යන අර්ථය 'ශබ්දය' යන අර්ථයට දක්වා සංවර්ධනය වී ඇත්තේ සාමවේද බ්‍රාහ්මණ ග්‍රන්ථවල දී බව ආචාර්ය බත ක්‍රිෂ්ණ ඝෝෂ් පෙන්වා දී තිබේ.[8] ඔහු සඳහන්කර ඇති ඇති පරිදි '**රථන්තර වර්ණා සෘච්**' යන සාමවේද බ්‍රාහ්මණ පාඨයේ දී වර්ණ ශබ්දයේ මූලික අර්ථය යටපත්ව ගීතයෙහි ශබ්දය යන අර්ථය ඉදිරිපත්ව තිබේ. පසුව එම අර්ථය ද යටපත් වී ශබ්දය යන සාමාන්‍ය අර්ථය සඳහා ම වර්ණ ශබ්දය යෙදී තිබේ.

පාලි සම්ප්‍රදාය තුළත් අක්ඛර යන්නෙහි මූලික අර්ථය කල් පවත්නා, ස්ථිර, ව්‍යඤ්ජනය ආදිය යි.[9] දීඝනිකාය ප්‍රථම භාගයෙහි 88 පිටෙහි අක්‍ෂර ශබ්දය යොදා ඇත්තේ සිව්වැදෑරුම් වෛදික අධ්‍යයන ශාඛාවන් හැඳින්වීම පිණිස ය.[10] ත්‍රිපිටක පරිබාහිර මූලාශ්‍රයවල දී ශබ්දය, නාදය (ධ්වනිය), වචන යන අර්ථ සඳහා ද අක්ඛර ශබ්දය යෙදී තිබේ.[11] ඊට අමතර ව ඡන්දස් ශාස්ත්‍රයේ දී syllable යන අර්ථය සඳහා මෙම ශබ්දය යෙදී තිබේ. (*අක්ඛර නියමො ඡන්දං*)

පාලි ව්‍යවහාරයේ දී වණ්ණ ශබ්දයෙන් ඉදිරිපත්වන්නේ පැහැය,[12] පෙනුම, වර්ණනාව ආදී අර්ථයන් ය.[13] පාලි ව්‍යාකරණයේ දී සංස්කෘත ආභාසය නිසා මූලික ශබ්ද හැඳින්වීම සඳහා මෙම ශබ්දය භාවිත කර තිබේ. සෑම සම්ප්‍රදායකට ම අයත් පාලි ව්‍යාකරණඥයෝ අක්ඛර හා වණ්ණ යන යෙදුම් දෙක ම භාවිත කළහ.

කච්චායනය අනුව ගිය රූපසිද්ධිය අකාරාදී වූ එක්සාළිසක් සංකේතවලට අක්ඛර යන නාමය ආරෝපණය කර තිබේ. (අක්ඛරාපාදයො එකචත්තාළීසං, රූසි.2) අක්ඛර ශබ්දයේ මූලික අර්ථය එලෙස ම රඳවාගන්නට රූපසිද්ධි කතුවරයා කැමති වූ බව '*නක්ඛරන්තීති අක්ඛරා* (ක්ෂය නොවන්නේ අක්ෂර නම් වේ.)'[14] යන විග්‍රහයෙන් පැහැදිලි වේ.

එහෙත් මොග්ගල්ලායනය අනුව ගිය පයෝගසිද්ධිය ශබ්ද සංකේත හැඳින්වීම සඳහා භාවිත කර ඇත්තේ වණ්ණ ශබ්දය යි. (අ ආදයො තිතාළීස වණ්ණා, පසි.1.1) එහි අර්ථය විග්‍රහ කරන්නට පයෝග සිද්ධි කතුවරයා යොමු වී නැතත් මොග්ගල්ලායන සම්ප්‍රදායයේ මතය වන්නේ වර්ණනා කිරීම යන අර්ථ සහිත වණ්ණ ධාතුවෙන් මෙම ශබ්දය නිපැයී ඇති බව යි.[15] මෙය ශබ්දිම (phoneme) සංකල්පය හා ආසන්න වෙයි. ශබ්දිමයක් සඳහා ද අර්ථයේ වෙනසක් අවශ්‍ය හෙයිනි.

## 2. සර

සර (සංස්. ස්වර) යන යෙදුම ද පාලි ව්‍යාකරණ සාහිත්‍යය තුළ සුනිශ්චිත වචනයකි. සංස්කෘත මූලය අනුව විමසන කල්හි එය ශබ්ද කිරීම යන අර්ථ ඇති ස්වෘ ධාතුවෙන් නිපන්නකි.[16] එහි මූලික අර්ථය ශබ්දය හෝ හඬ යන්න යි. ඍග්වේදයේ දී එම අර්ථයෙන් ම ස්වර ශබ්දය භාවිත වී තිබේ. පසුව එහි මුල් අර්ථය වෙනස් වී ස්වර අකුර යන අර්ථය වඩාත් මතු වී තිබේ. එය මුල්වරට දැකගත හැක්කේ ඓතරේය ආරණ්‍යකයේ යැයි චැටර්ජි පවසයි.[17] පතඤ්ජලීගෙන් ඉදිරියට පහළ වූ ව්‍යාකරණඥයෝ 'තනිව බබළති' යන අර්ථය ස්වර ශබ්දයට ආරෝපණය කළහ.[18] ඍග් ප්‍රාතිශාඛ්‍යයේ දී 'ස්වර' යන්නට 'බැබළීම' හා 'ශබ්දකිරීම' යන අර්ථ දෙකම ඉදිරිපත් වී තිබේ.[19]





පාලියෙහි සර යන්න හඬ හෙවත් ශබ්දය හා ස්වර අකුර යන අර්ථ දෙක සඳහා යෙදී ඇත. අංගුත්තර නිකාය[20] හා මිලින්දපඤ්හය[21] තුළ හඬ යන අරුතින් සර ශබ්දයේ භාවිතය දැකගත හැකිය.

සියලු පාලි ව්‍යාකරණඥයෝ ස්වර අකුරු සඳහා ම සර ශබ්දය යෙදූහ. **තත්‍රොදන්තා සරා අට්ඨ** (රූසි. 3), **සරා සරෙ ලොපං** (රූසි. 13) වැනි තැන්වල දී සර ශබ්දය භාවිත කළ රූපසිද්ධිය යෑම (ගමන), චලනය වීම යන අර්ථ ඇති සර ධාතුවෙන් සර ශබ්දය නිපන් බව පිළිගෙන ඇත. ඒ බව '**සරන්ති ගච්ඡන්තීති සරා, බ්‍යඤ්ජනෙ වා සාරෙන්තීති සරා**' යනුවෙන් සර ශබ්දය විග්‍රහ කර තිබීමෙන් පැහැදිලි වේ.

**දසාදො සරා** (පසි.1.2), **සරො ලොපො සරෙ** (පසි.1.9) වැනි සූත්‍රවල දී පයෝගසිද්ධිය ද සර ශබ්දය පාරිභාෂික ශබ්දයක් සේ භාවිත කර තිබේ. සර ශබ්දයේ ගමනාර්ථය පයෝගසිද්ධිය විසින් ද පිළිගෙන ඇති බව '**බ්‍යඤ්ජනෙ වා සාරෙන්තීති සරා**' යනුවෙන් එම ශබ්දය විග්‍රහ කිරීමෙන් පැහැදිලි වේ. එහෙත් එය විකල්ප අර්ථයක් බව විග්‍රහ වාක්‍යයේ ඇති වා ශබ්දයෙන් වටහා ගත යුතුය. වඩා වැඩි අගයකින් පයෝග සිද්ධිය සර ශබ්දයට යෝජනා කර ඇති අර්ථය සංස්කෘත සම්ප්‍රදායෙන් ඉදිරිපත් කළ තනිව බැබළීම් අර්ථය යි. ඒ බව විකල්පාර්ථය හඟවන වා ශබ්දයෙන් තොර වූ '**සප්පධානෙන පවත්තන්ති**' යන විග්‍රයෙන් පැහැදිලි වේ.[22]

## 3. සවණ්ණ/සරූප

**සවණ්ණ** (සංස්.සවර්ණ) යන්නෙහි පදාර්ථය එම පැහැය සහිත යනු යි. ව්‍යාකරණ සාහිත්‍යයේ දී එය සමාන ශබ්ද ඇති අක්ෂර යන අර්ථය නියෝජනය කරයි. **සවණ්ණ** ශබ්දය භාවිත කළ පාලි ව්‍යාකරණඥයෝ එය ස්වරවලට පමණක් සීමා කරගෙන තිබේ.

රූපසිද්ධිය **සවණ්ණ** යන්න භාවිත කර නැතත් **ක්වචාසවණ්ණං ලුත්තෙ** යන සූත්‍රයේ දී එහි විරුද්ධ පදය වන **අසවණ්ණ** යන යෙදුම භාවිත කර ඇත. සමාන වූ සවර්ණ අකුරු නැති එ, ඔ දෙක **අසවණ්ණ** නමින් ගණනය කෙරෙයි.[23] **පරසමඤ්ඤා පයොගෙ** (රූසි.11) යන

සූත්‍රයෙන් සංස්කෘතයෙහි ඇති ව්‍යාකරණ යෙදුම් පාලි ව්‍යාකරණය තුළ ද යෙදීමට අවකාශ උදාකළ රූපසිද්ධිය ඒ අතර එක් යෙදුමක් සේ දක්වා ඇත්තේ **සවණ්ණ** යන්න යි. මෙහි විස්තර වී ඇති පරිදි හ්‍රස්ව ස්වර ඊට අදාළ දීර්ඝ සවර සමඟ එක් ව ගත්විට **සවණ්ණ** යන ව්‍යවහාරයට වැටෙයි. ඊට ම **සරූප** යන නම ද භාවිත වේ.[24] මෙයින් පැහැදිලි වන්නේ ස්වරයන්හි හ්‍රස්ව දීර්ඝ භේදය අනුව රූපසිද්ධිය **සවණ්ණ** යන්න විස්තර කර ඇති බව යි.

**ද්වෙ ද්වෙ සවණ්ණා** (පසි.1.3) යන සූත්‍රයේ දී **සවණ්ණ** ශබ්දය භාවිත කළ පයෝගසිද්ධිය එය විග්‍රහ කර ඇත්තේ අක්ෂර පටිපාටිය අනුව ය. උක්ත සූත්‍රයට ලියූ විවරණයට අනුව අ, ආ වශයෙන් මුලින් ම ඇති අකුරු දහය දෙක බැගින් ගණනය කළ කල්හි **සවණ්ණ** ලැබෙයි.[25] මේ මුලින් ම ඇති අකුරු දහය නම් අ, ආ, ඉ, ඊ, උ, ඌ, එ, ඒ, ඔ, ඕ යන ස්වර දහය යි. එයින් පැහැදිලි වන්නේ පයෝගසිද්ධිය ද **සවණ්ණ** යන්න ස්වරවලට පමණක් සීමාකර භාවිත කර ඇති බව යි.

සමාන වූ වර්ණ **සවණ්ණ** නමින් ගැනෙන බව මෙහි ඇති '**සමානා සදිසා වණ්ණා සවණ්ණා**' යන විග්‍රහයෙන් පැහැදිලි වේ. එහෙත් එම 'සමාන වර්ණ' යන්න පැහැදිලි කිරීමට පයෝගසිද්ධිය පෙළඹී නැත.

### 4. බ්‍යඤ්ජන

**බ්‍යඤ්ජන** (සංස්. ව්‍යඤ්ජන) ශබ්දය **වි+අඤ්ජ්** (පැහැදිලිව දැක්වීම) ධාතුවෙන් නිපන්නකි. ව්‍යාකරණ විෂයෙහි ව්‍යඤ්ජන යනු ක කාරයේ සිට නිග්ගහීතය දක්වා වූ අක්ෂර තිස්තුන යි.[26] එහෙත් පාලි භාෂා විෂයෙහි **බ්‍යඤ්ජන** ශබ්දයෙහි අර්ථ දෙකකි. ඒ සලකුණ[27] හා අක්ෂරය යනුවෙනි.

සාමාන්‍යයෙන් **අත්‍ථ** යන්න සමග යෙදී ඇති **බ්‍යඤ්ජන** යන්නෙන් භාවාර්ථය හැඟවෙයි. (*සාත්‍ථං සබ්‍යඤ්ජනං*) ඊට හේතුව එය භාරතීය කාව්‍ය විචාරයන්හි සඳහන් වචනයේ බලතුනෙන් එකක් වීම යි.[28] එහෙත් මිලින්දපඤ්හයෙහි එන '....බ්‍යඤ්ජනතො.... අත්‍ථතො....'[29] යන්න තේරුම්ගත යුත්තේ 'අක්ෂර වශයෙන් ද අර්ථ වශයෙන් ද' යනුවෙනි.



බුද්ධඝෝෂ හිමියන් සමන්තපාසාදිකාවේ දී 1399 වරක් **බ්‍යඤ්ජන** ශබ්දය යොදා ඇති අතර ඊට ස්වර, ව්‍යඤ්ජන යන දෙක ම ඇතුළත් කර තිබේ.[30] එයින් පැහැදිලි වන්නේ අටුවා යුගයට පෙරත් එම යුගය තුළත් **බ්‍යඤ්ජන** ශබ්දයෙන් පොදුවේ අක්ෂරයන් ගණනය කර ඇති බව යි. එහෙත් නෙත්තිප්පකරණයෙහි සඳහන් ෂඩ්විධ බ්‍යඤ්ජන පදයන්හි[31] (අක්ඛර, පද, බ්‍යඤ්ජන, නිරුත්ති, නිද්දෙස, ආකාර) තෙවැන්න වන **බ්‍යඤ්ජන** යන්නට අටුවා ලියූ ධම්මපාල හිමියන්ට අනුව බ්‍යඤ්ජන යනුවෙන් ගැනෙන්නේ ක කාරාදි තනි අකුරු නොව අර්ථ ප්‍රකාශක පද සමුදාය සංඛ්‍යාත වූ වාක්‍යයක් මැ යි.[32]

පාණිනී ව්‍යාකරණයෙහි එන **අඤ්චො න්‍යාදානෙ** (පා. 8. 2. 48) සූත්‍රයට විවරණ ලියූ පතඤ්ජලී ව්‍යඤ්ජන ශබ්දයේ සූපරසාර්ථයක් ද පෙන්වා දී තිබේ. (*ව්‍යජ්‍යතෙ'නෙනෙති ව්‍යඤ්ජනම්*, (මහා, III, 408- 409) මෙයින් පැහැදිලි වන්නේ සලකුණ, අක්ෂරය, වාක්‍යය, සූප රසය යන අර්ථ සතර සඳහා ම **බ්‍යඤ්ජන** ශබ්දය භාවිත වන බව යි. මේවායින් ව්‍යාකරණ විෂයෙහි ප්‍රකටව ඇත්තේ 'අක්ෂර' යන අර්ථය ම ය. එහි දී අක්ෂර යනු සියලු අක්ෂර නොව ක කාරයේ සිට බින්දුව කෙළවර කර ඇති අක්ෂරයන් ය. ඒ සියල්ල ව්‍යඤ්ජනාක්ෂර යන නමින් හඳුන්වනු ලැබේ.

චැටර්ජි සඳහන් කර ඇති පරිදි ව්‍යඤ්ජනාක්ෂර යන අර්ථයෙන් ව්‍යඤ්ජන ශබ්දය මුල්වරට යෙදී ඇත්තේ ගොපථ බ්‍රාහ්මණයේ දී ය.[33] පාලි ව්‍යාකරණඥයෝ ද එම අර්ථය සඳහා ම **බ්‍යඤ්ජන** ශබ්දය භාවිත කළහ.

'අර්ථය ප්‍රකාශ කෙරෙයි' යන අර්ථයෙන් **බ්‍යඤ්ජන** ශබ්දය යෙදෙන බව රූපසිද්ධි මතය යි. රූපසිද්ධිය එහි හයවැනි සූත්‍රයේ දී **බ්‍යඤ්ජන** ශබ්දය භාවිත කර ඇත. (සෙසා බ්‍යඤ්ජනා, රූසි. 6) එහි අනුවෘත්තියෙන් පැහැදිලි කර ඇති ආකාරයට ස්වර අට හැරුණු විට ඉතිරිවන මාත්‍රා භාගයක් ඇති කකාරයේ පටන් බින්දුව දක්වා වූ අකුරු තිස්තුන ව්‍යඤ්ජන නම් වේ. මෙම විවරණයේ දී ව්‍යඤ්ජනාක්ෂරයක උච්චාරණ කාලය පිළිබඳ විශේෂ අදහසක් ඉදිරිපත් කිරීමට රූපසිද්ධි කතුවරයා පෙළඹී ඇත. එනම්, ව්‍යඤ්ජනාක්ෂරයක අර්ධ මාත්‍රාවක් ඇති බව යි.

බ්‍යඤ්ජන පිළිබඳ රූපසිද්ධි විග්‍රහයට සමානව ම පයෝග සිද්ධිය කාදයො බ්‍යඤ්ජනා (පසි. 1.6) යන සූත්‍රයෙන් කකාරයේ පටන් නිග්ගහීතය දක්වා වූ අකුරු තිස් තුන බ්‍යඤ්ජන ලෙස ගැනෙන බව පැහැදිලි කරයි. අර්ථය ප්‍රකාශ කෙරෙයි යන අර්ථයෙන් ම මෙහි දී ද බ්‍යඤ්ජන ශබ්දය භාවිත කර ඇත. ඒ බව **'බ්‍යඤ්ජීයති අත්‍ථො එතෙහීති බ්‍යඤ්ජනා'** යන විග්‍රහයෙන් පැහැදිලි වේ.

## 5. රස්ස

උච්චාරණයේ දී එක් මාත්‍රාවක් ඇති වර්ණය හෝ ස්වරය **රස්ස** නම් වේ. රස්ස (සංස්. හ්‍රස්ව) ශබ්දය පිටක සාහිත්‍යයේ දී කෙටි යන අර්ථයෙන් යෙදී තිබේ.[34] ජාතකපාළි තෙවන කාණ්ඩයේ 480 පිටෙහි **රස්සාදෙස** යන විශේෂ යන යෙදුමක් හමුවේ. හ්‍රස්ව අකුරු ආදේශ කිරීම යන අර්ථය එයින් ඉදිරිපත් වෙයි. මිලින්දපඤ්හය[35] ද හ්‍රස්ව ස්වර හැඟවීම පිණිස **රස්ස** යන්න යොදා තිබේ.

කාලයේ පදනම මත ස්වර අකුරු වර්ග කරන රූපසිද්ධිය ලඝු මාත්‍රා ඇති අ, ඉ, උ යන ශබ්ද සංඥා තුන **රස්ස** යනුවෙන් හඳුන්වයි. **රස්ස** යන යෙදුම විග්‍රහ කරන්නට රූපසිද්ධිය පෙළඹී නැතත් මාත්‍රා පදනම මත **රස්ස** යන්න භාවිත කර ඇති බව නම් ඉතා පැහැදිලි ය. අසුරු ගැසීම්, ඇසිපිය හෙළීම් සංඛ්‍යාත කාලය හඟවන මාත්‍රාවලින් එකක් **රස්ස** නමින් ගැනෙන බව රූපසිද්ධි මතය යි.[36]

**පුබ්බො රස්සො** (පසි.1.4) යන සූත්‍රයේ දී **රස්ස** ශබ්දය භාවිත කළ පයෝගසිද්ධිය පළමුව සවර්ණ පදනම මත හ්‍රස්ව ස්වර ඉදිරිපත් කර තිබේ. ස්වර දහයෙහි දෙක බැගින් වූ සවර්ණයන්හි පළමු අකුර **රස්ස** යන සංඥාවෙන් ගැනෙන බව සූත්‍ර අනුවෘත්තියේ දී සඳහන් කර ඇත.[37] ඒ අනුව කෙටි කාලයක දී (රස්ස කාල) උච්චාරණය කරන්නට සුදුසු නැතහොත් එම කාලය තුළ අවසන් වන අක්ෂර **රස්ස** නම් වේ. පයෝගසිද්ධිය මෙහි දී **රස්ස කාල** යනුවෙන් සලකා ඇත්තේ අසුරු ගැසීම්, ඇසිපිය හෙළීම් සංඛ්‍යාත කාලය යි. එය රූපසිද්ධියෙහි ඇති **මත්තා** ශබ්දයෙන් අදහස් කරන ලද අර්ථ ම ය.[38] ඒ අනුව අ, ඉ, උ, එ, ඔ යනුවෙන් හ්‍රස්ව ස්වර පහකි. ඒවායින් අවසන් දෙක සංයෝගයකට පූර්වව ම යෙදෙයි.





## 6. දීඝ

**දීඝ** යන්නෙහි අර්ථය දිග හෝ දීර්ඝ යනු යි. පාලි පිටක සාහිත්‍යය තුළ දිග යන අර්ථයෙන් **දීඝ** ශබ්දය යෙදී තිබේ.[39] මිලින්දපඤ්හයෙහි[40] දිග ස්වරය යන අර්ථය සඳහා ද මෙම ශබ්දය යෙදී ඇත.

රූපසිද්ධිය **දීඝ** ශබ්දය යොදා ඇත්තේ මාත්‍රා දෙකක් ඇති ස්වර හැඳින්වීම සඳහා ය. (ද්විමත්තා .... දීඝා) ආ, ඊ, ඌ යන ස්වර තුනත් එ, ඔ යන අතිරේක ස්වර දෙකත් සමග දීර්ඝ ස්වර පහක් එහි ඉදිරිපත්ව ඇත. එහෙත් අවසන්ව දැක් වූ ස්වර දෙක සංයෝගයක පූර්වයෙහි ඇති විට හ්‍රස්වව උච්චාරණය කරනු ලබයි.[41] දීර්ඝ කාලයකින් යුතු බැවින් හෝ දීර්ඝ කාලයකින් නිමවන නිසා හෝ **දීඝ** යන නාමය යෙදෙන බව මෙහි සවිස්තර ව දැක්වේ. (*දීඝකාලයුත්තා තබ්බන්තො වා දීඝා*)

අ ආදි සවර්ණයන්හි දෙවැනි ව ඇති වර්ණ **දීර්ඝ** නමින් ගැනෙන බව පයෝගසිද්ධිය කියයි. ඒ අනුව ඒවා ආ, ඊ, ඌ, එ හා ඔ වශයෙන් නම් කර ඇත. දීර්ඝ වේලාවක් උච්චාරණය වන නිසා හෝ දීර්ඝ කාලයකින් නිමවන නිසා හෝ **දීඝ** යන නම භාවිතා කෙරෙන බව පයෝගසිද්ධිය ද පිළිගෙන තිබේ. (*දීඝකාලයොගා තබ්බන්තාය වා දීඝා*)

## 7. වග්ග

**වග්ග** (සංස්. වර්ග) යන්නෙහි පදාර්ථය කාණ්ඩය, කොටස, කණ්ඩායම (සමූහය), පක්ෂය හෝ මාලාව යනු යි.[42] ඊට අමතරව පිටක ග්‍රන්ථයක කොටස හෝ පරිච්ඡේදය යන අර්ථය සඳහා ද **වග්ග** ශබ්දය යෙදී ඇත.[43] (උදා: අට්ඨකවග්ග, පාරායනවග්ග, මහාවග්ග, චූල්ලවග්ග)

රූපසිද්ධිය **වග්ග** ශබ්දය භාවිත කර ඇත්තේ සමූහය යන අර්ථයෙනි. ඒ බව **'වග්ගොති සමූහො'** (රූසි. 7) යන විග්‍රහයෙන් පැහැදිලි වේ. **වග්ගා පඤ්චපඤ්චසො මන්තා** (රූසි. 9) යන සූත්‍රයේ දී **වග්ග** යන යෙදුම භාවිතා කරමින් ම කාරයෙන් කෙළවර වන පසක් බැගින් අක්ෂර ඇති කොටස් පහ **වග්ග** නමින් හඳුන්වා තිබේ.

කවග්ග - ක ඛ ග ඝ ඞ
චවග්ග - ච ඡ ජ ඣ ඤ
ටවග්ග - ට ඨ ඩ ඪ ණ
තවග්ග - ත ථ ද ධ න
පවග්ග - ප ඵ බ භ ම යනු එම වර්ග පහ යි.

මෙහි ඒ ඒ වර්ගය හඳුන්වා ඇත්තේ එම වර්ගයේ පළමු අකුර අනුව ය.[44] ව්‍යඤ්ජනාක්ෂර පහක් ඇති අකුරු කාණ්ඩ පස වග්ග නමින් ගැනෙන බව පයෝගසිද්ධි මතය යි. (පසි. 1.7) එහි දී ද ඒ ඒ වර්ගය නම්කර ඇත්තේ එම වර්ගයේ පළමු අක්ෂරය අනුව ම ය. ඒ අනුව කකාරයේ පටන් මකාරය දක්වා වූ අක්ෂර වග්ග යටතට වැටෙයි. වෙසෙසින් ම පයෝගසිද්ධිය යොදාගෙන ඇති වග්ග ශබ්දයෙන් 'ඉවත් කිරීම' යන අර්ථය ඉදිරිපත් වෙයි. **'වජ්ජෙන්ති යකාරාදයොති වග්ගා'** යන විග්‍රහයෙන් එම අර්ථය ප්‍රකාශ වෙයි.[45] එයින් විස්තර වන්නේ යකාරාදිය හෙවත් ය, ව, ර, ල යන අකුරු සතර ඉවත් කර ගණනය කරන අක්ෂර වග්ග නම් වන බව යි.

## 8. ගරු - ලහු

ගරු (සංස්. ගුරු) ශබ්දයේ මූලික අර්ථය 'බර' වන අතර **ලහු** (සංස්. ලඝු) ශබ්දයේ අර්ථය සැහැල්ලු යනු යි. පාලියේ දී ගුරුවරයා හා වැදගත් යන අර්ථ දෙක සඳහා ද ගරු ශබ්දය යොදනු ලැබේ.[46] මිලින්දපඤ්හයේ දී හා සුමංගලවිලාසිනියේ දී[47] ඡන්දස් විෂයෙහි වන දීර්ඝ හා කෙටි ස්වර හැඟවීමට ගරුක, ලහුක යන යෙදුම් යොදා තිබේ. සමන්තපාසාදිකාවේ දී පමණක් එම අර්ථය සඳහා මෙම ශබ්ද දෙක 1399 වතාවක් යෙදී ඇත. කච්චායනයෙන් ඉදිරියට එන පාලි ව්‍යාකරණඥයෝ ගරුක, **ලහුක** යන ශබ්ද දෙක ගරු හා **ලහු** සේ සංක්ෂේප කර භාවිත කර ඇත.

ගරු - **ලහු** යන සංක්ෂේප ශබ්ද දෙක සේ ම ඒවායේ විස්තාරිත ශබ්ද වන ගරුක **ලහුක** යන ශබ්ද දෙක ද රූපසිද්ධියේ දී හමුවේ.[48] එහි සවැනි (දුම්හි ගරු) සූත්‍රයෙන් ගරු යන සංඥාව ඉදිරිපත්කර තිබේ. එයින් නිර්දිෂ්ට පරිදි සංයෝගාක්ෂරයකට පූර්වයෙන් ඇති හ්‍රස්ව අකුරු[49]



හා ස්වභාව දීර්ඝ ස්වර ද ගරු නමින් සලකනු ලැබේ.[50] **ලහු** යන්න වෙන ම විග්‍රහ කිරීමට රූපසිද්ධිය පෙළඹී නැති අතර ගරු සංඥාවෙන් අන්‍ය වූ ලක්ෂණය **ලහු** ලෙස දක්වා තිබේ.[51]

**ලහුස්සුපන්තස්ස** යන සූත්‍රයේ දී **ලහු** ශබ්දය භාවිත කරන පයෝගසිද්ධිය එය විස්තර කිරීමට පෙළඹී නැත. රූපසිද්ධියේ එන ගරු ශබ්දයට සමානව පයෝගසිද්ධියේ යොදා ඇත්තේ ගුරු ශබ්දය යි. **ගුරු පුබ්බාරස්සා රෙන්තෙන්තීනං** (පසි. 6.8) සූත්‍රයේ දී ගුරු ලහු දෙක පැහැදිලි කරන පයෝගසිද්ධිය

*අක්ඛර නියමො ඡන්දං - ගුරු ලහු නියමො භවෙ වුත්ති*
*දීඝො සංයොගාදි පුබ්බො - රස්සො ගරු ලහු තු රස්සො*[52]

යන ගාථාවෙන් පෙන්වා දී ඇත්තේ දීර්ඝ ස්වරය හා සංයෝගයකට පූර්ව වූ හ්‍රස්ව ස්වරය ගුරු වන බවත් හා හ්‍රස්ව ස්වරය (ස්වභාව) **ලහු** බවත් ය.

## 9. සිථිල - ධනිත

පදාර්ථය අනුව **සිථිල** යනු ලිහිල්, සැහැල්ලු යන අර්ථය යි. ධනිත යනු ශබ්ද කළ, හඬ නැගූ යනුයි. මූලික පිටක ග්‍රන්ථවල හමුනොවන වචන දෙකක් වන මේවා මිලින්දපඤ්හයේ දී[53] විශේෂ ශබ්ද ලක්ෂණ හැඳින්වීම සඳහා යොදා තිබේ. බුද්ධඝෝෂ හිමියන් සමන්තපාසාදිකාවේ දක්වා ඇති දශවිධ ව්‍යඤ්ජනපදවලින් පළමුවැන්න හා දෙවැන්න ලෙස විස්තර කර ඇත්තේ මෙම **සිථිල** - ධනිත යන දෙකයි. ඒ අනුව **සිථිල** යනු වර්ග ව්‍යඤ්ජන පන්තීන්හි පළමු හා තෙවන අක්ෂරයන් ය. ධනිත යනු දෙවැනි හා සතරවැනි අක්ෂරයන් ය.[54]

සාවද්‍ය අර්ථයන් නිපදවන අක්ෂර විපත්තීන් ඇති බව පිළිගන්නා රූපසිද්ධිය **සිථිල** හා ධනිත යනුවෙන් අක්ෂර විපත්ති දෙකක් පෙන්වා දී තිබේ.[55] මෙම පාරිභාෂික ශබ්ද දෙක හමුවන පළමු රූපසිද්ධි සටහන මෙය වන අතර දෙවැන්න වන්නේ **පරසමඤ්ඤා පයොගෙ** (රූසි.11) යන සූත්‍රයෙහි අනුවෘත්තිය යි. ඉන් පරිබාහිර ස්ථානයක දී මෙම ශබ්ද දෙක දැකගත නොහැකිය. මෙහි ධනිත යනු වර්ගාක්ෂරයන්හි දෙවැනි

සහ සිව්වැනි අක්ෂරයන් ය. එනම්, මහප්‍රාණාක්ෂරයන් ය. ඉතිරි ඒවා සිථිල හෙවත් අල්පප්‍රාණාක්ෂරයන් ය.[56] මෙලෙස සිථිල හා ධනිත යන ශබ්ද දෙකින් ප්‍රකාශිත අක්ෂර හඳුන්වා දී ඇති නමුත් එම වචනවලින් කවර අර්ථයක් හැඟවෙන්නේ දැයි විවරණය වී නොමැත.

පයෝගසිද්ධිය විස්තර කිරීමකින් තොරව සිථිල හා ධනිත අක්ෂර නිසා ඇතිවන අක්ෂර විපත්තිය අර්ථය සාවද්‍ය බවට පත්කරවන බව පමණක් ප්‍රකාශ කර සිටියි.[57] එම විස්තරය ඊට ම ආවේණික වූවක් නොවන්නේ පෙර දැක්වූ පරිදි රූපසිද්ධියේ ද ඒ පිළිබඳව සඳහන් වන බැවිනි.[58]

## 10. ඝොස - අඝොස

ඝොස (සංස්. ඝෝෂ) ශබ්දයේ පදාර්ථය හඬ හෝ නාදය යනු යි.[59] මේ අර්ථය පාලියේ ද දක්නට ඇත.[60] අඝොස (සංස්. අඝෝෂ) යනු ඝොස යන්නෙහි නාස්ත්‍යර්ථ පදය යි. සංස්කෘත ව්‍යාකරණඥයින් අනුව ගිය පාලි ව්‍යාකරණඥයෝ ව්‍යාකරණ පාරිභාෂික ශබ්ද ලෙස ඝොස - අඝොස යන යෙදුම් දෙක භාවිත කළහ.

ව්‍යාකරණය හා සම්බන්ධ බොහෝ පාරිභාෂික ශබ්ද සංස්කෘතයෙන් ඇදගන්නට අවසරදීම සඳහා පරසමඤ්ඤාපයොගෙ (රූසි. 11) යන සූත්‍රය රචනා කළ රූපසිද්ධිය එහි අනුවෘත්තියේ දී ඝොස-අඝොස දෙක වචනාර්ථ දැක්වීමකින් තොරව ඊට ඇතුළත් වන අක්ෂර පමණක් දක්වමින් වෙසෙසින් විස්තර කර ඇත. ඒ අනුව වර්ගාක්ෂරයන්හි පළමු දෙවැනි අකුරු හා සකාරය අඝොස ගණයට වැටේ. තෙවැනි සිව්වැනි හා පස්වැනි අකුරු සහ ය, ර, ල, ව, හ, ළ යන අකුරු ඝොස ගණයට වැටේ.[61] එමෙන් ම 42 වැනි රූපසිද්ධි සූත්‍රයේ ද මෙම යෙදුම් දෙක විස්තර කිරීමකින් තොරව භාවිත කර තිබේ.[62]

පයෝගසිද්ධිය මෙම යෙදුම් දෙකකින් එකක් හෝ භාවිත කර නැත. ඝොස - අඝොස අකුරු පිළිබඳව සඳහන් කිරීම සඳහා ව්‍යඤ්ජන පන්තිය තුළ ඒවායේ පිහිටීම් ස්ථානය දැක්වීම පයෝගසිද්ධි ක්‍රමය යි. චතුත්ථ දුතියෙස්වෙසං (පසි.1.35) යන සූත්‍රය ඊට උදාහරණ යි.





## 11. නිග්ගහීත

බින්දුව හැඳින්වීම යොදනු ලබන නිග්ගහීත යන්න පාලියෙහි විශේෂ ව්‍යාකරණ පාරිභාෂිකයකි. සංස්කෘතය හා සසඳන විට සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථවල ඇති අනුස්වාර යන්නට මෙය සමාන වේ. අනුස්වාර යන්නෙහි අර්ථය ස්වරයන් අනුව යන යනු යි.[63] හ්‍රස්ව, දීර්ඝ යන විශේෂයක් නොකොට සියලු ම ස්වරයන් අනුව යන හෙයින් ඒ නාමය යොදනු ලැබේ. ශබ්දස්තෝමමහානිධියෙන් උපුටා ව්‍යාකරණසද්දසින්ධුවෙහි දක්වා ඇති පරිදි උදාත්තාදි ස්වරයන් ඇති බැවින් ස්වර වර්ණයෝ ම ස්වාර නම් වෙත්. ඔවුන් අනුව යන්නේ අනුස්වාර නම් වේ.[64] (උදාත්තාදි ස්වරවත්ත්වාත් ස්වරවර්ණා එව ස්වාරාඃ අනුගතඃ ස්වරාන් ගතිස) එහෙත් නිග්ගහීත යන්නෙහි අර්ථය ඊට වඩා වෙනස් ය. සද්දනීතියට අනුව නිග්ගහීත යනු ශාසනික ව්‍යවහාරයේ පමණක් දක්නට ලැබෙන වචනයකි.[65]

පිටක ග්‍රන්ථවල දී බින්දුව යන පාරිභාෂික අර්ථයෙන් නිග්ගහීත යන්න යෙදී නැති අතර මුල්වරට ඒ පිළිබඳ සටහනක් හමුවන්නේ සමන්තපාසාදිකාවේ දී ය. එහි විස්තර වන පරිදි නිග්ගහීත යනු උච්චාරණ කරණය රහිත ව වඩා විවෘත නොවූ මුවින් නාසික ව උච්චාරණය කරනු ලබන ශබ්දය යි.[66] සියලු පාලි ව්‍යාකරණඥයෝ බින්දුව හැඳින්වීම පිණිස නිග්ගහීත යන පාරිභාෂික ශබ්දය ම භාවිත කළහ.

අං ඉති නිග්ගහීතං (රූසි. 10) යන සූත්‍රයේ දී මුල්වරට නිග්ගහීත ශබ්දය භාවිත කළ රූපසිද්ධිය අං යන තැන අකාරයෙන් පරව යෙදූ බින්දුව නිග්ගහීත නමින් හඳුන්වා ඇත.[67] එය අර්ථ දෙකකින් නිග්ගහීත නම් වන බව රූපසිද්ධි මතය යි.[68]

i) හ්‍රස්ව ස්වරයකින් පසුව උච්චාරණය කරන හෙයින්
ii) උච්චාරණ කරණය නොගෙන වඩා විවෘත නොවූ මුවින් උසුරුවන නිසා

මෙම රූපසිද්ධි විවරණය පාලි ව්‍යාකරණ ග්‍රන්ථයක ප්‍රථමවරට නිග්ගහීතය විවරණය වූ ආකාරය පෙන්වා දෙයි.

පයෝගසිද්ධිය **බින්‍දු නිග්ගහීතං** (පසි. 1.8) යන සූත්‍රයෙන් බින්‍දුව ම නිග්ගහීතය ලෙස හඳුන්වා දී තිබේ. එයින් ගම්‍ය කරනුයේ නිග්ගහීතයේ හැඩය හෙවත් ස්වරූපය යි. රූපසිද්ධියෙහි දැක්වූ අර්ථ දෙකින් ම නිග්ගහීතය භාවිතයට ගැනීමට පයෝගසිද්ධිය ද පෙළඹී තිබේ.[69]

## 12. වුද්ධි - ගුණ

වුද්ධි (සංස්. වෘද්ධි) යන්නෙහි අදහස 'වැඩිවීම' යනු යි. සංස්කෘතයෙහි ආ, ඓ, ඖ යන අක්ෂර සඳහා වෘද්ධි යන නාමය දී තිබේ.[70] පාලියේ දී ආ, එ, ඔ ලෙස ඒවා පෙනී සිටියි. ඓ, ඖ යන ශබ්ද දෙක පාලියෙහි නැත. එම නිසා පාලි ව්‍යාකරණඥයෝ එ, ඔ යන අක්ෂර වර්ග කිරීමේ දී වෘද්ධි යන්න පමණක් භාවිත කළහ. සංස්කෘතයේ ගුණ අකුරු ලෙස නම් වී ඇති එ, ඔ දෙක පාලියේ දී වෘද්ධි ලෙස නම් කළ බැවින් ගුණ යන බෙදීමක් නැවත අවශ්‍ය නොවීය.

වුද්ධි යන්න රූපසිද්ධියේ 350 වැනි සූත්‍රයේ දී (**අයුවණ්ණානං චායො වුද්ධි**) යෙදී තිබේ. එහි විස්තර කර ඇති ආකාරයට ආ, එ, ඔ යන ස්වර වෘද්ධි නම් වේ. එහෙත් මෙය වුද්ධි යන්නෙන් ගැනෙන අක්ෂර හඳුන්වාදීම පමණක් මිස පාරිභාෂික ශබ්දයක් ලෙස අර්ථ ගැන්වීමක් නොවේ. මීට අමතරව **මා යූන මාගමො ඨානෙ** (රූසි. 360) සූත්‍රයෙන් වුද්ධි ආගමය නම් ව්‍යාකරණ විධියක් ද ඉදිරිපත් වේ. සුදුසු තැන දී ඉ, උ දෙකට එ, ඔ ආගමය වන බව එයින් විහිත කාර්යය යි.

රූපසිද්ධියේ 572 වැනි සූත්‍රයේ දී[71] ගුණ ශබ්දය භාවිත කර ඇතත් එය තේරුම් ගතයුත්තේ එහි පාරිභාෂික අර්ථයෙන් නොවන බව මහාරූපසිද්ධි සන්නයේ දී **ගුණභූතානං** යන පදයට සැපයී ඇති "ගුණ වූ අප්‍රධාන වූ විශේෂ වූ .........." යන සන්න පාඨයෙන් පැහැදිලි වේ.[72]

වුද්ධි යන්න ආ, එ, ඔ යන ස්වරවලට යෙදෙන පූර්වාචාර්ය සංඥාවක් ලෙස හැඳිනගත් පයෝගසිද්ධිය[73] එය භාවිත නොකොට එහි ස්වරූපය විස්තර කර තිබේ. තද්ධිත පද සාධනයේ දී මූර්ධජ ණ කාරය සහිත ප්‍රත්‍යයක් පරව ඇති විට නාමයේ ආදි ස්වර සේ පවතින අකාරය, ඉවර්ණය හා උවර්ණය පිළිවෙළින් ආ, එ, ඔ බවට පත්වන බව ප්‍රකාශ කරමින් වෘද්ධියේ ස්වරූපය විස්තර කිරීම ඊට නිදසුන් ය.



(**සරානමාදිස්සා යුවණ්ණස්සා එ ඔ නානුබන්‍ධෙ**, පසි. 4.2) මේ අතර ගුණ යන පාරිභාෂික ශබ්දය පයෝගසිද්ධියෙන් ඉවත්වී තිබේ.

## 13. උපධා

උපධා (උප + ධා - පිහිටුවීමේ ) යනු ශබ්දයක අවසන් අකුරට මුලින් ඇති අකුර හැඳින්වීම සඳහා භාවිත ව්‍යාකරණ පාරිභාෂික ශබ්දය යි. එහි පදාර්ථය සමීපයේ හෝ ඉදිරියේ පැවැතීම යි.[74] පාලියේ දී ව්‍යාකරණයට පමණක් සීමා වී ඇති **උපධා** යන වචනය සංස්කෘත ව්‍යාකරණ සම්ප්‍රදායෙන් ණයට ගත්තකි.

රූපසිද්ධිය සඳහන් කරන ආකාරයට **උපධා** යනු පදයක අවසන් අක්ෂරයෙන් පූර්වයෙහි වූ අක්ෂරයට යෙදෙන පරසමඤ්ඤාවකි. එනම්, සංස්කෘත පාරිභාෂික ශබ්දයකි.[75] ගහ (උපාදානෙ) යන ධාතුවේ උපධාවට හෙවත් ග කාරයේ අකාරයට එකාරයක් වන බව **ගහස්සුපධස්සෙ වා** (රූසි. 553) යන සූත්‍රයෙන් නීතියක් ලෙස පෙන්වා දී ඇත. මීට අමතර ව 418 වැනි සූත්‍රයට අදාළ විස්තරවල එන '**ඉවණ්ණුවණ්ණන්තානඤ්ච ලහූපන්තානධාතූනං**' යන පාඨයේ දී මේ සඳහා **උපන්ත** යන ශබ්දය ද භාවිත කර ඇත. රූපසිද්ධි ටීකාවේ විස්තර කර ඇති පරිදි උප + අන්ත යන ශබ්ද දෙකින් සෑදුණු **උපන්ත** යන්නෙහි අර්ථය අන්තය සමීපයේ පවතින යනු යි.[76] ඇතැම්විට මේ **උපන්ත** ශබ්දය මොග්ගල්ලායනය ඇසුරෙන් තනාගත් නව ශබ්දයක් විය හැකිය.

**උපධා** යන්න වෙනුවට පයෝගසිද්ධිය භාවිත කර ඇත්තේ **උපන්ත** යන පාරිභාෂික ශබ්දය යි.[77] එය ස්වකීය ආචාර්ය පරපුර අනුව යාමකි. ඊට හේතුව **ලහුස්සුපන්තස්ස** (මො. 5.83) යන සූත්‍රයේ දී මොග්ගල්ලානය ද **උපන්ත** ශබ්දය භාවිත කර තිබීම යි. එය පළමුවරට උපධා යන්න සඳහා උපාන්ත ශබ්දය යොදාගත් චාන්ද්‍ර ව්‍යාකරණයේ[78] ආභාසයෙන් මොග්ගල්ලායනය තනාගත් නව පාලි වචනයකි.

## 14. අනුබන්ධ

වෘද්ධි ආදි ව්‍යාකරණ කාර්යයක් පිණිස යොදාගනු ලබන ණ ආදි අක්ෂර ව්‍යාකරණයේ දී අනුබන්ධ යන නමින් හඳුන්වයි. අනුබන්ධ (අනු+බධ -බන්ධනෙ) යන්නෙහි මූලික අර්ථය බන්ධනය යි.[79]

ව්‍යාකරණ පාරිභාෂික ශබ්දයක් ලෙස පළමුවරට කච්චායන ව්‍යාකරණයේ දී හමුවන අනුබන්ධ (කාරිතං විය ණානුබන්ධො, කච්. 623) යන්න රූපසිද්ධියේ දී විස්තර වී ඇත්තේ "අනුබන්ධො අප්පයොගී ණකාරානුබන්ධො පච්චයො" (රූසි. 537) යනුවෙනි. එයින් ප්‍රකාශ වන්නේ ව්‍යවහාරයෙහි නොයෙදෙන අනුබන්ධය යනු ණ කාරය හා බැඳුණු ප්‍රත්‍යය නම් වන බව යි. මේ අප්‍රයෝගිත්වය නම් වෘද්ධිකිරීම ආදි තමාට අදාළ කාර්යය නිමවීමෙන් පසු නැවත ප්‍රයෝජනයක් නොමැති බව යි.

පයෝගසිද්ධිය කගචජානං සානුබන්ධෙ (පසි. 7.7), අස්සාණානුබන්ධෙ (පසි. 7.8) යන සූත්‍රවල දී සානුබන්ධ, ණානුබන්ධ යන වචනවල දී අනුබන්ධ යන්න භාවිත කර ඇත. ඒවායින් අදහස් වන්නේ ස කාරය හා බැඳුණු ණ කාරය හා බැඳුණු යනු යි. එහෙයින් ඒ තැන්වල අනුබන්ධ යන්න යෙදී ඇතත් එයින් ගම්‍ය වන්නේ එහි පාරිභාෂික අර්ථයට වඩා වචනයේ වාච්‍යාර්ථය බව පැහැදිලි ය.

15. ඨාන - කරණ - පයතන

වාච්‍යාර්ථය අනුව ඨාන යන්නෙහි අර්ථය ස්ථානය හෙවත් තැන වන අතර කරණ යනු උපකාර වන දෙයයි. පයතන යනු උත්සාහය යි. ව්‍යාකරණ සන්දර්භයේ දී මේ වචන පාරිභාෂික යෙදුම් සේ භාවිත වෙයි. ඒ අනුව ඨාන යනු අක්ෂර උත්පත්ති ස්ථානයන් ය. කරණ යනු අකුරු ඉපදීමට උපකාර වන තොල, දිව වැනි අවයවන් ය. පයතන යනු අක්ෂර උච්චාරණය කිරීම සඳහා දරනු ලබන උත්සාහය යි.

මෙම වචන තුන භාවිත කරන පළමු පාලි ව්‍යාකරණය රූපසිද්ධිය යි. ඒ අනුව කණ්ඨ, තාලු, මුද්ධ, දන්ත, ඔට්ඨ හා නාසිකා යනුවෙන් අක්ෂර උත්පත්ති ස්ථාන හයකි. දිව මැදත් (ජිහ්වාමධ්‍ය) දිව අග ළඟත් (ජිහ්වොපාග්‍ර) දිව අගත් (ජිහ්වාග්‍ර) එමෙන් ම ඒ ඒ උත්පත්ති ස්ථානත් කරණය ලෙස පෙනී සිටියි. අක්ෂර උච්චාරණය සඳහා දරන උත්සාහය ද සිව්වැදෑරුම් වේ. එනම්,

සංවුත (හැකුළුණු බව)

විවට (ඇරුණු බව)

ඵුට්ඨ (ගැටෙන බව)

ඊසම්ඵුට්ඨ (මඳක් ගැටෙන බව)

## සාරාංශය

ශබ්ද විචාරය හා සම්බන්ධ පාලි ව්‍යාකරණ පාරිභාෂික ශබ්ද පිළිබඳව කරන ලද ඉහත විමර්ශනයෙන් පැහැදිලි වන්නේ පාලි ව්‍යාකරණය ඊට අදාළ පාරිභාෂික ශබ්දමාලාවකින් පෝෂිත බව යි. ඒවා බොහෝ විට සංස්කෘත ව්‍යාකරණය හා බද්ධ වී සිටියි. මෙහි ලා ඒ පිළිබඳ අධ්‍යයනයක් නොකළ නමුත් නිග්ගහීත යන ව්‍යාකරණ පාරිභාෂික ශබ්දය පාලි අට්ඨකථා තුළින් බිහි වී පාලි ව්‍යාකරණයට ඇතුළත් වූ සංස්කෘත ව්‍යාකරණයට සාධාරණ නොවන ව්‍යාකරණ පාරිභාෂික ශබ්දයක් සේ ගණනය කළ යුතු වේ.

## ආන්තික සටහන්

1 ලක්වර්ථං හි සංඥාකරණම්, *Mahābhāsya of Patañjali,* Ed. Kielhorn, Pune, Bhandarkar Oriental Research Institute, 1952, 1.39

2 *මහාරූපසිද්ධි,* (රූසි) සංස්. කළුකොඳයාවේ පඤ්ඤාසේඛර හිමි, කොළඹ, ගුණසේන මුද්‍රණාලය, 1964, පි. 155

3 තිවිධා හි සඤ්ඤා. අන්වත්ථ සඤ්ඤා. සක සඤ්ඤා. පර සඤ්ඤාති. තා පන අක්ඛරවග්ග සොස සඤ්ඤාදිවසෙන දීපෙතබ්බා, *මුඛමත්තදීපනී* (මුදී), සංස්. වැලිවිටියේ ධම්මරතන හිමි, කොළඹ, රාජකීය මුද්‍රණාලය, 1898, පි. 9

4 *Saddanīti,* Ed. H.Smith, London, Oxford University press. 1928, p. 608-609

5 *ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය,* ප්‍රථම භාගය, සංස්. වැලිවිටියේ සෝරත හිමි, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1999, පි. 9

*A Sanskrit English Dictionary* (SED), Monier Williams, Oxford, 1984, p.3

*Pail English Dictionary* (PED), TW Rhys Davids, William Stede, Delhi, (First Indian edition)1993, p.2

6 PED, p.569, SED, p. 924

7 K.C. Chatterji, *Technical Terms and Technique of Sanskrit Grammar,* Calcutta, 1964, University of Calcutta, pp.279

8 Ibid

9 *Dīgha Nikāya* I (D I), Ed. W.Stede, Pali Text Society (PTS), London, 1932, p.86

10 ibid, p.88

11 *Milindapañha* (Milin), Ed. V. Trenckner, PTS, London, 1962, p.344
Petavatthu *Aṭṭhakathā* (PvA), Ed. P.Masefield , PTS, London, 1980, p. 280

12 *Suttanipāta* (Sn), Ed. D. Anderson and H. Smith, PTS, London, 1965, V.447

13 PED, pp.596 - 597

14 රූසි. පි. 10

15 වණ්ණියති අත්‍ථො එතෙහීති වණ්ණා, මොග්ගල්ලායන පඤ්චිකා

16 SED, p.1285

17 Chatterji, op.cit, 1964, p.219

18 ස්වයං රාජන්තෙ ස්වරා, *Mahābhāṣya* of Patañjali, 1. 206

19 ස්වර්යන්තෙ ශබ්දයන්තෙ ඉති ස්වරාඃ ibid, 1.3

20 *A IV*, p.307

21 *Milin*, p.340

22 සප්පධානභාවෙන පවත්තන්ති, බ්‍යඤ්ජනෙ වා සාරෙන්තීති සරා, පසි. පි. 3

23 නත්‍ථි එතෙසං සවණ්ණාති අසවණ්ණා. එකාරොකාරා, එම, පි. 14

24 රස්සසරා සකදීඝෙහි අඤ්ඤමඤ්ඤං සවණ්ණා නාම යෙ සරූපාතිපි වදන්ති, රූසි. පි.13

25 අආදිස්වාදිමෙසු දසසු ද්වෙ ද්වෙ සවණ්ණා නාම හොන්ති, පසි. 1.3 සූත්‍ර අනුවෘත්තිය

26 *ව්‍යාකරණසද්දසින්ධු* (ව්‍යාසසි), සංස්. විදුරුපොල පියතිස්ස හිමි. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2002 (දෙවැනි සංස්කරණය), පි. 535

27 PED, p.492

28 අභිධා, ලක්‍ෂණා හා ව්‍යඤ්ජනා යන එම ශක්තීන් පිළිබඳ විවරණයක් සඳහා ලබුගම ලංකානන්ද හිමිපාණන් වහන්සේ සංස්කරණය කළ සුබොධාලංකාරයෙහි 41-48 පිටු බලන්න.

29 Milin, p.18 (... තීහි මාසෙහි බ්‍යඤ්ජනතො පරියාපුණිත්වා පුන තීහි මාසෙහි අත්‍ථතො මනසාකාසි.)

30 සිථිල ධනිතඤ්ච දීඝරස්සං ගරුකං ලහුකං ච නිග්ගහීතං
සම්බන්ධං වවත්‍ථිතං විමුත්තං දසධා බ්‍යඤ්ජන බුද්ධියා, සපා. IV, 1948, පි. 1042

31 අක්ඛරං පදං බ්‍යඤ්ජනං නිරුත්ති තථෙව නිද්දෙසො ආකාරඡට්ඨ වචනං එත්තාව බ්‍යඤ්ජනං සබ්බං, *Nettippkaraṇa (Netti)*, Ed. E. Hardy, PTS, London, 1961, p. 4

32 ව්‍යඤ්ජනන්ති සංඛෙපතො වුත්තං පදාභිතං අත්‍ථා බ්‍යඤ්ජයතීති බ්‍යඤ්ජනං. වාක්‍යං තං පන අත්‍ථතො පද සමුදායොති දට්ඨබ්බං........ *නෙත්තිප්පකරණට්ඨකථා* (නෙඅ), සංස්. විදුරුපොල පියතිස්ස හිමි, කොළඹ, හේවාවිතාරණ මුද්‍රණය, 1920, පි. 12

33 උදාත්තොදාත්ත ද්විපදාදෙ ඉත්‍යර්ධවතශ්‍රෙ මාත්‍රමකාරෙ ව්‍යඤ්ජනම් ඉත්‍යාහුඃ (1.1.25)

34 *Dīgha Nikāya* I (D I), Ed. T.W. Rhys Davids and J.E. Carpenter, PTS, London, 1949, pp.193, 223, Sn. V.633, *Dhammapada* (Dh), Ed. S.Sumangala Thera, PTS, London, 1914, V. 409, DhA IV, p.184

35 Milin, p.334

36 මත්තා සද්දො චෙත්ථ අච්ඡරාසංඝාත අක්ඛිනිමීලන සංඛාතං කාලං වදති. තාය මත්තාය එකමත්තා රස්සො, රූසි. පි. 11

37 තෙසෙව්ව දසසු යෙ ද්වෙ සවණ්ණා තෙසු යො යො පුබ්බො සො රස්ස සඤ්ඤො හොති, පසි. පි. 3

38 රස්ස කාල යොගා තබ්බන්තතාය වා රස්සා. රස්සකාලො නාම අච්ඡරා සංඝාතො අක්ඛි නිමීමීලන සංඛාතො කාලො. තෙන එකමතෙතා රසෙසා, රූසි. පි. 3

39 *D I*, p.17, *Majjhima Nikāya* I (M I), Ed. V. Trenckner and R. Chalmers, PTS, London, 1979, p.429

40 *Milin*, p.334

41 ක්වචි සංයොග පුබ්බා එකාරොකාරා රස්සා ඉව වුච්චන්තෙ, රූසි. පි. 11

42 PED, p.591

43 ibid

44 තෙ පන පඨමක්ඛරවසෙන කවග්ගචවග්ගාදි වොහාරං ගතා, රූසි. පි. 12

45 පසි. පි. 4

46 *A III*, p.110, *Saṅyutta Nikāya* I (S I), Ed. M.L. Feer, PTS, London, 1960, p.24, Sn. V.326

47 *Milin*, p.344, *Dīgha Nikāya Aṭṭhakathā* (DA I), Ed. T.W. Rhys Davids, J.E. Carpenter PTS, London, 168, p.177

48 ගරුකතො අඤ්ඤො ලහුකොති වෙදිතබ්බො. රූසි. පි. 12

49 සංයොගභූතෙ අක්ඛරෙ පරෙ යො පුබ්බො රස්සක්ඛරො සො ගරුසඤ්ඤො හොති. එම. පි. 11

50 දීඝො ච සරො ගරුසඤ්ඤො හොති. එම, පි. 12

51 ගරුකතො අඤ්ඤො ලහුකොති වෙදිතබ්බො. එම.

52 පසි. 6. 8

53 *Milin*, p.344

54 සපා IV, 1948, පි. 1042

55 සිථිලධනිතාදි අක්ඛරවිපත්තියං හි අත්ථස්ස දුන්නයතා හොති. රූසි. පි. 9

56 එත්ථ ච වග්ගානං දුතියචතුත්ථා ධනිතාතිපි වුච්චන්ති. ඉතරෙ සිථිලාති වුච්චන්ති. එම, පි. 13

57 සිථිල ධනිතාදි අක්ඛරවිපත්තියං හි අත්ථස්ස දුන්නයතා හොති. පසි. පි. 1

58 රූසි. පි. 1

59 ඝොෂණං ඝොෂා ධ්වනිරුච්‍යතෙ. දුර්ග ටීකා, 1.1.11

60 PED, p.258

61 තත්ථ වග්ගානං පඨමදුතියක්ඛරා සකාරො ච අඝොසා. වග්ගානං තතිය චතුත්ථපඤ්චමා ය ර ල ව හ ළා වාති එකවීසති ඝොසා නාම. රූසි. පි. 13

62 වග්ගෙ ඝොසා ඝොසානං තතිය පඨමා, එම. 42

63 අනුස්වර්යතෙ සංලීනං ශබ්ද්‍යතෙ ඉත්‍යානුස්වාරඃ දුර්ගටීකා, 1.1.19

64 ව්‍යාසසි, පි. 291

65 නිග්ගහීතන්ති සාසනෙ වොහාරො. සනී, පි, 8

66 නිග්ගහීතන්ති යං කරණානි නිග්ගහෙත්වා අවිස්සජෙත්වා අවිවටෙන මුඛෙන සානුනාසිකං කත්වා වත්තබ්බං. සපා IV, පි. 1518

67 අං ඉති යං අකාරතො පරං වුත්තං බින්දු තං නිග්ගහීතං නාම හොති. රූසි. පි. 12

68 රස්සසරං නිස්සාය ගය්හති. කරණං නිග්ගහෙත්වා ගය්හති. එම

69 පසි. පි. 4

70 ආරෛඖ වෘද්ධිඃ, *Sārasvata Vyākaraṇa*, p. 2

71 ඉය තම කි එසානමන්තස්සරො දීඝං ක්වචි දිඝස්ස ගුණං දොරං සඛී ච, රූසි. 572

72 ගුණභූතානං ගුණ වූ අප්‍රධාන වූ විශේෂ වූ .......... මරූසන්, පි. 375

73 ආ එ ඔ නං වුද්ධීති පුබ්බාචරිය සඤ්ඤා, පසි. 4.2

74 උපාධානං උපධා. දුර්ගටීකා, 2.1.11
උපධීයතෙ උපධා, ව්‍යාසසි, පි. 136

75 උපාධාති අන්තක්ඛරතො පුබ්බක්ඛරස්ස පරසමඤ්ඤා, රූසි. පි. 258

76 ලහුභූතො සරො උප අනෙත අන්තසමීපෙ පවත්ති එතෙසන්ති ලහුපන්තා රූපසිද්ධි ටීකා, පි. 433

77 ලහු භූතස්ස උපන්තස්ස ඉයුවණ්ණස්ස එ ඔ හොන්ති යථාක්කමං, පසි. පි. 224

78 මාද් උපාන්තාච් ච මතොර් වඃ, *Cāndra Vyākaraṇa*, Ed. Bruno liebich, Leipzig, 1902, 6.3.35

79 *M III*, p.170, *Itivuttaka* (It) Ed. E. Windisch, PTS, London, 1948, p.191